# කෘෂි ක්ෂේත්‍රයේ තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනයට මිලියන 500ක්

**13. කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාවය**

කෘෂිකාර්මික අංශය මගින් රටේ ශ්‍රම බළකායෙන් දළ වශයෙන් සියයට 30කට රැකියා සපයන අතර කෘෂිකාර්මික අංශය ග්‍රාමීය ආර්ථිකයේ කොඳු නාරටිය වෙනවා. එමගින්, කෘෂිකාර්මික අංශයේ විභවයන් වැඩිදියුණු කිරීම, ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයකගේ ආර්ථික අවස්ථා වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අවශ්‍යතාවක්.

කෘෂිකාර්මික අංශය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය එහි ඵලදායීතාව, තරගකාරිත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම අරමුණු කර ගෙන ඇත. වී ගොවීන් සඳහා පොහොර සහනාධාරය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා රජය දැනටමත් 2025 වසර සඳහා රුපියල් මිලියන 35,000ක් වෙන් කර තිබෙනවා. ගුණාත්මක බීජ සංවර්ධනය, එල්ලංගා පද්ධති කළමනාකරණය සහ කෘෂිකර්මාන්තය තුළ කාර්යක්ෂම ලෙස ජලය භාවිතය ආදීය ප්‍රමුඛතා ක්ෂේත්‍ර ලෙස රජය හඳුනාගෙන ඇති අතර අයවැය ප්‍රතිපාදන මගින් එම ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරනවා.

● **ප්‍රමාණවත් වී ආරක්ෂණ තොගයක් පවත්වා ගැනීම**

වී මිල නිරන්තරයෙන් පවතින අස්ථායීතාවයෙන් මිදීම සඳහාත් වෙළෙඳපොළේ සහල් ඉල්ලුම සහ සැපයුම සීමා කිරීමේ දී ඊට ඔරොත්තු දීමේ පියවරක් ලෙසත් 2024/25 මහ කන්නයේ සිට ප්‍රමාණවත් ආරක්ෂණ තොගයක් පවත්වා ගැනීමට අපේක්ෂා කරනවා. ඒ අනුව, 2024/25 මහ කන්නය සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

● **තොරතුරු පද්ධති**

කෘෂිකාර්මික අංශයට කාලීන තීරණ ගැනීම සඳහා යාවත්කාලීන කරන ලද දත්ත සහ තොරතුරු පද්ධතියක් නැහැ. එබැවින් නිෂ්පාදන ස්ථානයේ සිට පාරිභෝගිකයන් දක්වා සමස්ත වටිනාකම් දාමය ආවරණය වන පරිදි යාවත්කාලීන කරන ලද දත්ත සහ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කරනවා. මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහය සමගින් දැනටමත් ක්‍රියාත්මක "ආහාර සුරක්ෂිත ජීවනෝපාය හදිසි ආධාර ව්‍යාපෘතිය" මගින් මුලදී සහාය දක්වන අතර පසුව ලෝක බැංකුවෙහි "ඒකාබද්ධ ග්‍රාමනගර සංවර්ධන සහ දේශගුණික ඔරොත්තු දීමේ ව්‍යාපෘතියෙන්" ලැබෙන අරමුදල් සමඟ පුළුල් කිරීමට අපේක්ෂා කරනවා.

● **අනෙකුත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය වැඩි කිරීම**

වී වලට අමතරව ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අනෙකුත් ක්ෂේත්‍ර භෝගවල නිෂ්පාදනය සහ ඵලදායීතාව ඉහළ නැංවීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනවා. විශේෂයෙන්ම මුං ඇට, උඳු, මිරිස්, රතු ලූනු, කව්පි, සෝයා, බඩ ඉරිඟු, අර්තාපල් සහ අනෙකුත් තෝරාගත් ධාන්‍ය වර්ග මෙන්ම අල භෝග නිෂ්පාදනය, 2025-2027 මධ්‍යකාලීනව කඩිනම් වැඩපිළිවෙළක් හරහා වර්ධනය කිරීමට නියමිතයි. 2025 වසර සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබාදුන් ප්‍රතිපාදනයන්ට අමතරව රුපියල් මිලියන 500ක් මේ සඳහා ලබා දීමට අප යෝජනා කරනවා.

වෙළෙඳපොළේ වී සහ සහල් තොග එකතු කිරීම සහ ගබඩා කිරීම නියාමනය කිරීම සඳහා නියාමන රාමුවක් සකස් කිරීම අවශ්‍ය වෙනවා. ඒ සඳහා, වී සහ සහල් එකතු කිරීම සහ ගබඩා කිරීම නියාමනය කිරීමේ බලතල පැවරීම සඳහා වී අලෙවි මණ්ඩල පනත සංශෝධනය කිරීමට අප යෝජනා කරනවා.

● **නිෂ්පාදනය සඳහා ඉඩම් යොදාගැනීම**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC), ප්‍රාදේශීය වැවිලි සමාගම් (RPCs), ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB) විසින් පාලනය කරන ඇතැම් වතු, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC), ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB) විසින් කළමනාකරණය කරනු ලබන, ඌන උපයෝජිත ඉඩම් හඳුනාගෙන එම ඉඩම්වල යෝග්‍යභාවය පිළිබඳ සැලකිල්ලට ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ඇතුළත් පුද්ගලික ආයෝජන සඳහා යොමු කිරීමට කටයුතු කරනවා. මේ සම්බන්ධයෙන් මූලික කටයුතු සිදුකිරීමට අප රුපියල් මිලියන 250ක් වෙන් කරනවා.

● **තරුණ ව්‍යවසායකයින් සහ නිෂ්පාදක සමුපකාර**

වර්තමානයේ සාර්ථක නිෂ්පාදක සමුපකාර ක්‍රමවේද පිළිබඳ ගෝලීය උදාහරණ බොහොමයක් තිබෙනවා. ෆොන්ටෙරා, නවසීලන්ත කිරි නිෂ්පාදන සමුපකාරයක්. අමුල් යනු ඉන්දියානු කිරි ගොවි සමුපකාරය වන අතර, ස්පාඤ්ඤයේ මොන්ඩ්‍රගොන් සේවක සමුපකාරය මේවාට හොඳ ගෝලීය උදාහරණ වනවා.

සමුපකාර යන්ත්‍රණය දියුණු කරන විකල්ප නිෂ්පාදන ප්‍රවේශයක් අනුගමනය කිරීමට අප යෝජනා කරනවා. ඉඩම්, කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සහ වෙනත් ආධාර සැපයීම තුළින් රජය මෙම සමුපකාර යන්ත්‍රණයන්ට සහාය දීමට අපේක්ෂිතයි. මෙම ක්‍රමවේදයේ නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට සහ අවශ්‍ය යටිතල පහසුකම් සහ මූල්‍ය දිරිගැන්වීම් ලබාදීම සඳහා 2025 වසරේ දී රුපියල් මිලියන 100ක් වෙන් කරනු ලබනවා.

● **කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තරුණ ව්‍යවසායකත්ව සංවර්ධනය**

කෘෂිකර්මාන්තය පදනම් කරගත් ව්‍යාපාර ආරම්භ කිරීමට මුලපුරන, සුළු හා මධ්‍ය පරිමාණ තරුණ ව්‍යවසායකයින් සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනවා. මේ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

● **කිරි නිෂ්පාදනය**

දැනට දේශීය කිරි නිෂ්පාදනය ප්‍රමාණවත් වන්නේ දේශීය ඉල්ලුමෙන් සියයට 45ක් පමණ සපුරාලීමට පමණයි. කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කිරි නිෂ්පාදන අගය දාම වැඩිදියුණු කිරීම සහ දැනට ක්‍රියාත්මක වන අන්තර් සම්බන්ධතා සංවර්ධන ව්‍යාපෘතිය හරහා කිරි ගොවිපළ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා 2025-2026 වසර සඳහා රුපියල් මිලියන 2,500ක් ආයෝජනය කිරීමට අප යෝජනා කරනවා.

● **වාරිමාර්ග අංශයේ සංවර්ධනය**

ග්‍රාමීය ජනගහනයෙන් සියයට 75ක් පමණ කෘෂිකාර්මික අංශය පදනම් කරගත් ආර්ථිකයක් තුළ කටයුතු කරනවා. 2025 වසරේ වාරිමාර්ග අංශයේ සංවර්ධනය සඳහා රාජ්‍ය අංශයේ සමස්ත ආයෝජනය රුපියල් මිලියන 78,000ක් වෙනවා.

මල්වතු ඔය, ගිංගඟ, නිල්වලා, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධනය, මුන්දේනි ආරු ව්‍යාපෘතිය ඇතුළු නව ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘති මධ්‍ය කාලීනව පවතින මූල්‍ය අවකාශය තුළ ප්‍රමුඛතාව සලකා ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනවා.

ගල්ඔය, රාජාංගණය, මින්නේරිය සහ හුරුළු වැව යෝජනාක්‍රමවල පහළ සංවර්ධන කටයුතු ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2025 දී රුපියල් මිලියන 2,000ක් ලබාදීමට අප යෝජනා කරනවා.






**14. වැවිලි සහ අනෙකුත් අපනයන භෝග**

● **පොල් නිෂ්පාදනය වැඩි කිරීම**

පොල් නිෂ්පාදන සඳහා ගෝලීය ඉල්ලුම අඛණ්ඩව වැඩිවෙමින් පවතින අතර, කර්මාන්තකරුවන් විසින් පුරෝකථනය කර ඇති පරිදි, 2030 වසරේ දී රටේ මුළු ගෙඩි අවශ්‍යතාවය ගෙඩි මිලියන 4,500ක් වනවා. එහිදී ගෙඩි මිලියන 1,800ක් ගෘහස්ත පරිභෝජනය සඳහා භාවිත කිරීමට අපේක්ෂා කරන අතර ඉතිරි ගෙඩි මිලියන 2,700 කර්මාන්ත කටයුතු සඳහා භාවිත කිරීමට අපේක්ෂා කරනවා.

පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශ මත ස්ථාපිත උතුරු පොල් ත්‍රිකෝණයේ නව පොල් ඉඩම් අක්කර 16,000 ක් සිටුවීම සඳහා උතුරු ප්‍රදේශයේ වගාකරුවන්ට ඉහළ අස්වැන්නක් සහිත පොල් පැළ සහ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

> **රාජ්‍ය සේවය ඩිජිටල්කරණයට රු. මිලියන 3000ක්**
>
> **කලාකරුවන් හා මාධ්‍යවේදීන්ට මහල් නිවාස සංකීර්ණයක්**

● **අනෙකුත් අපනයන භෝග - කුළුබඩු**

කුරුඳු වැනි සාම්ප්‍රදායික අපනයනවල අගය එකතු කිරීම පුළුල් කිරීම සඳහා පියවර ගැනීමට නියමිතයි. මෙම නිෂ්පාදන අලෙවිකරණය සහ ප්‍රවර්ධනය ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල හරහා වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනවා. සැපයුම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ ජාත්‍යන්තර හවුල් ව්‍යාපාර හරහා අගය එකතු කළ අපනයනකරුවන් සමඟ සම්බන්ධ වීමට පහසුකම් සැලසීම සඳහා රජය ගොවීන්ට තාක්ෂණික සහාය ලබා දෙනවා.

ගෝලීය වටිනාකම් දාමයන්ට සම්බන්ධ වීම සඳහා, ලංකා කුරුඳු සහ අනෙකුත් අපනයන භෝග සඳහා ඒකාබද්ධ නිෂ්පාදන සංවර්ධන සහ වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**15 ධීවර හා ජලජීවී වගාව**

මිරිදිය ඉස්සන් බීජ ලබාගැනීමේ හැකියාව සීමිත වීම ශ්‍රී ලංකාවේ මිරිදිය ඉස්සන් වගා කර්මාන්තය සහ සාම්ප්‍රදායික නොවන ජලජීවී වගාව තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන බාධාවක් ලෙස හඳුනාගෙන තිබෙනවා. ටැංකිවල මිරිදිය ඉස්සන් ගබඩා කිරීම ප්‍රවර්ධනය කිරීම සහ අපනයන ආර්ථිකය දෙසට අනාගත නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා, ගොවි ප්‍රජාව/ධීවර සමිති සහ ප්‍රාදේශීය ප්‍රජාවන් බලගැන්වීම සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ආකෘතියක් යටතේ මිරිදිය ඉස්සන් අභිජනනාගාර, ගොවි සමුපකාර සහ අලෙවිකරණ ජාල ස්ථාපිත කිරීම සහ එවැනි අලෙවිකරණ ජාල සමඟ සම්බන්ධ වීමට ගොවි සමිතිවලට පහසුකම් සලසනවා. මේ සඳහා, රුපියල් මිලියන 200ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

**16. සමාජ ආරක්ෂණය**

වයස්ගත ජනගහනය වැඩිවීම, කාන්තා ශ්‍රම බළකා සහභාගිත්වය අඩු වීම සහ ශ්‍රම වෙළෙඳපොළ හැකිළීම ආදී හේතු නිසා රට තුළ අභියෝගාත්මක තත්ත්වයක් නිර්මාණය වී තිබෙනවා. තවද, ළමුන්, අඩු ආදායම්ලාභී කාන්තාවන්, වැඩිහිටියන්, දුප්පතුන් සහ විශේෂ හැකියා සහිත පුද්ගලයින් ඇතුළුව ඇතැම් කොටස් අතර අසමානතාවන් සහ අවදානම් විශේෂයෙන් පවතින බව නිරීක්ෂණය වෙනවා. එබැවින්, ඵලදායී හා සමාන හවුල්කරුවන් ලෙස සමාජයට ඒකාබද්ධ කර ගනිමින් ඔවුන් ආරක්ෂා කිරීම සහ බලගැන්වීම රජයේ වගකීමක්.

● **"අස්වැසුම" ප්‍රතිලාභ ඉහළ නැංවීම**

අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් මත පැටවී ඇති බර ලිහිල් කිරීම සඳහා, සමාජ ප්‍රතිලාභ ලේඛනයේ සිටින අය සඳහා මුදල් ප්‍රදාන වැඩි කිරීමෙන් ඔවුන් ආරක්ෂා කිරීමට රජය අවශ්‍ය පියවර ගන්නවා. ඒ අනුව, රජය 2025 වසරේ දී සමාජ ආරක්ෂණ වියදම් සඳහා රුපියල් බිලියන 232.5 දක්වා ශුද්ධ වියදම වැඩි කර තිබෙනවා. දුප්පතුන් සහ අන්ත දුප්පතුන් යන සමාජ කණ්ඩායම් දෙකටම ගෙවනු ලබන මාසික ප්‍රතිලාභ දීමනාව පිළිවෙළින් රුපියල් 8,500 සිට රුපියල් 10,000 දක්වා සහ රුපියල් 15,000 සිට රුපියල් 17,500 දක්වා 2025 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කළා. 2025 මාර්තු 31 වන දින ගෙවීම් අවසන් වීමට නියමිතව තිබූ සංක්‍රාන්ති මට්ටමේ සිටි සමාජ කණ්ඩායම් සඳහා ප්‍රතිලාභ ගෙවීමේ කාලය 2025 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කිරීමට අප යෝජනා කරනවා. තවද, අස්වැසුම වැඩසටහනට ඇතුළත් නොවූ, එහෙත් සුදුසුකම් ලත් අයට යෝජනා ක්‍රමයට ඇතුළත් වීමට තවත් අවස්ථාවක් ලබා දෙමින් 2025 මැයි මාසයේ දී නව තෝරාගැනීම් අවසන් කිරීමට අපේක්ෂා කරනවා.

● **වකුගඩු රෝගීන් / ආබාධිත / වැඩිහිටි දීමනාව වැඩි කිරීම**

වකුගඩු රෝගීන් සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන මාසික දීමනා රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා සහ වැඩිහිටි පුද්ගලයින් සඳහා වන මාසික දීමනා රුපියල් 3,000 සිට රුපියල් 5,000 දක්වා 2025 අප්‍රේල් සිට ක්‍රියාත්මක වන පරිදි වැඩි කිරීමට අප යෝජනා කරනවා.

● **තිරසර වෙනසක් සඳහා "අස්වැසුම" ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම**

රජයේ ප්‍රතිපත්තිය අනුව මිලියන 1.2 ක් වූ අස්වැසුම ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් දේශීය සහ විදේශීය අරමුදල් භාවිත කර සවිබල ගන්වනවා. ආසියානු සංවර්ධන බැංකුවේ සහ ලෝක බැංකුවේ අරමුදල් සපයන ව්‍යාපෘතිවල සහය ඇතිව නියමු ව්‍යාපෘතියක් යටතේ, සවිබල ගැන්විය යුතු පවුල් විසිපන්දහසක් තෝරාගෙන තිබෙනවා. විභවතාවය සහිත/සුදුසුකම්ලත් ඉතිරි පවුල් ක්‍රමානුකූලව, දේශීය අරමුදල් යොදා ගනිමින් සවිබල ගැන්වීමට අපේක්ෂා කරනවා. ඒ අනුව, සවි බලගැන්වීමේ වැඩසටහන සඳහා වෙන්කිරීම් රුපියල් මිලියන 500 කින් වැඩි කිරීමට අප යෝජනා කරනවා.

අධ්‍යාපනයට අදාළ ලිපි ද්‍රව්‍ය සහ පොත්පත් මිලදී ගැනීමට සහාය වීම සඳහා අඩු ආදායම් ලත් කණ්ඩායම්වලින් එක් සිසුවෙකු සඳහා රුපියල් 6,000ක් ලබා දීම දැනටමත් ප්‍රකාශයට පත් කර ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන්ම ආර්ථික අර්බුදයේ දිගුකාලීන බලපෑම්වලට ඔරොත්තු දීමට උපකාර කිරීම සඳහා ධීවර ප්‍රජාවගේ ජීවනෝපාය මාර්ගයට ආධාර කිරීම පිණිස 2024 වසරේ ඔක්තෝබර් මාසයේ සිට 2025 වසරේ මාර්තු මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ භූමිතෙල් සහනාධාරය වෙනුවෙන් ලබා දී ඇති මුළු මුදල රුපියල් බිලියන 3ක්.

> **මහපොළ ශිෂ්‍යාධාර රු. 7500 දක්වා වැඩිකෙරේ**
>
> **ගැබිනි මාතාවන්ට පෝෂ්‍යදායි ආහාර ලබාදෙන්න මිලියන 7500ක්**

● **පරිවාස-පුනරුත්ථාපන/සහතිකලත් පාසල්/රිමාන්ඩ් භාරයේ සහ ළමා සුරැකුම් මධ්‍යස්ථානවල සිටින ළමුන්ගේ සුබසාධනය වැඩි දියුණු කිරීම**

මේ වන විට සහතික ලත් පාසල්/රැඳවුම් නිවාස/ළමා නිවාස 379ක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මෙයින් ආයතන 47ක් රජය විසින් ක්‍රියාත්මක කරනවා. මෙම නිවාසයන්හි පහසුකම් ඉතා අඩු මට්ටමක පවතින අතර ඇතැම් ස්ථානවල ආරක්ෂාව පවා ප්‍රමාණවත් නොවන බව පෙනී ගොස් තිබෙනවා. ඇතැම් ගොඩනැගිලි අලුත්වැඩියා කළයුතු වන අතර ඇතැම් දිස්ත්‍රික්කවල පවතින නිවාසවල ප්‍රමාණවත් ඉඩකඩක් පවා නොමැති බවත් පෙනී යනවා.



එබැවින්, ළමයින්ගේ සුරැකුම් මධ්‍යස්ථානවල ධාරිතාවය භෞතික වශයෙන් සහ මානව සම්පත් සංවර්ධනය යන අංශවලින් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ වෙනුවෙන් රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

● **චූදිත ළමුන් අධිකරණවලට සහ එහි සිට ප්‍රවාහනය කිරීමේදී ආයතනගත ළමුන් සඳහා ළමා-හිතකාමී ප්‍රවාහන ක්‍රමයක් ස්ථාපනය කිරීම**

ප්‍රමාණවත් නොවන ප්‍රවාහන පහසුකම් ඇතුළු බොහෝ හේතූන් මත ආයතනගත නිවස්නයන්හි සිටින ළමයින් දැඩි අවදානමක සිටින බව අප විසින් නිරීක්ෂණය කර තිබෙනවා. ඒ අනුව ඒ සඳහා සුදුසු වාහන මිලට ගැනීමට 2025 වසර සඳහා රුපියල් මිලියන 250ක මුදලක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

● **අනාථ දරුවන් සහ තරුණයින් සඳහා සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම**

අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව සහ සෑම පුරවැසියෙකුටම ගෞරවාන්විත සහ සුරක්ෂිත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව ලබා දීම සහතික කිරීමට රජය දක්වන කැපවීමට අනුකූලව, අනාථ දරුවන් සඳහා පුළුල් සමාජ ආරක්ෂණ සහ නිවාස ලබාදීමට අප යෝජනා කරනවා. මෙම මූලික ක්‍රියාමාර්ගයන් ඔවුන්ට දිගුකාලීන සහයෝගය, කුසලතා සංවර්ධනය සහ මූල්‍ය සුරක්ෂිතභාවය ලබා දෙන අතර, ආර්ථිකයට ධනාත්මක ලෙස දායක විය හැකි සවිබල ගැන්වූ පුද්ගලයන් ලෙස ඔවුන්ගේ යහපැවැත්ම සහ සමාජයට ඒකාබද්ධ වීම සහතික කරනු ඇත.

2025 වසරේ අයවැය මගින් රජයේ ආයතනවල සහ රැඳවුම් නිවාසවල දරුවන්ගේ සුබසාධනය සඳහා යෝජනා ඉදිරිපත් කර ඇත. මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමේදී අදාළ ආයතන පහත කරුණුවලට ප්‍රමුඛත්වය දිය යුතුය.

i. රැඳවුම් නිවාසවල සිටින ළමුන්ට සහ අනාථ දරුවෙකුට රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දෙනවා. එයින් රුපියල් 2,000ක් එම දරුවාගේ ගිණුමට තැන්පත් කළ යුතු අතර, ඉතිරි රුපියල් 3,000 දරුවන්ගේ වියදම් සඳහා ඔවුන්ගේ නීත්‍යනුකූල භාරකරුවන්ට ලබා දෙනු ඇත. 2025 වසරේ අයවැයෙන් අප මේ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

ii. මෙම දරුවන්ගෙන් බොහෝ දෙනෙකුට නිවාස හා ආරක්ෂාව සමඟ තම ජීවිතය ආරම්භ කිරීමට උපකාර කිරීම සඳහා පවුල් පසුබිමක් හෝ ආධාරක පද්ධතියක් නොමැත. එබැවින්, මෙම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් නිවාස ලබා ගැනීමට නොහැකි වීම නිසා විවාහය කල් දමමින් සිටින අතර එය සමාජ ආතතියට සහ ආර්ථික විෂමතාවන්ට හේතුවනවා. ඔවුන්ට බැංකු ඉතිරිකිරීම් පදනමක් සපයන අතර, නිවෙසක් තැනීමේ පිරිවැය පියවා ගැනීමට එය බොහෝ විට ප්‍රමාණවත් නොවේ. මෙම යථාර්ථය සැලකිල්ලට ගනිමින්, ස්ථාවර සහ ආරක්ෂිත නිවෙසක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 1ක නිවාස ආධාර ප්‍රදානයක් අප යෝජනා කරනවා. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා, රජය 2025 අයවැයෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කරනවා.

iii. රැකවරණ නිවාසවල සහ රජයේ පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සිටින දරුවන්ට පාසල් අධ්‍යාපනය ලබා දීමේදී නිසි අධ්‍යාපන පහසුකම් සහිත ළඟම ඇති ජාතික හෝ පළාත් සභා පාසලට ඇතුළත් වීමට අවස්ථා සහතික කිරීමට අප අපේක්ෂා කරනවා.

iv. පුනරුත්ථාපන මධ්‍යස්ථානවල පුනරුත්ථාපනය වන තරුණ තරුණියන්ට NVQ මට්ටමේ 3 හෝ 4 ගුණාත්මක වෘත්තීය/කුසලතා පුහුණුවක් ලබා දෙන පුනරුත්ථාපන ක්‍රමවේද අනුගමනය කිරීම, නිදහස් වීමෙන් පසු වෘත්තියක් හෝ ජීවනෝපායක් සහිත යහපත් හා ඵලදායී පුරවැසියන් ලෙස සමාජයට සම්බන්ධ වීමට ඔවුන්ට හැකි වීම, පුනරුත්ථාපනය වූ සහ යහපත් හැසිරීමක් පෙන්නුම් කරන අයට සුදුසු රැකියාවක් ලබා ගැනීමට බාධාවක් නොවන ආකාරයෙන් පොලිස්/ග්‍රාම සේවා සහතික නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අපගේ රජය අවධානය යොමු කරනවා.

v. රැඳවුම් නිවාසවල දරුවන් වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු සමාජයට නැවත ඒකාබද්ධ කරන විට සහ එවැනි දරුවන් (විශේෂයෙන් කාන්තාවන් සඳහා) විවාහ වන විට රජයේ නිවාස ආධාර, පුහුණුව සහ රැකියා බඳවා ගැනීම් සඳහා සුදුසුකම් මත ප්‍රමුඛතාවය ලබා දීමට අප කටයුතු කරනවා.

vi. රැඳවුම් නිවාසවල දරුවන් වයස අවුරුදු 18 සම්පූර්ණ කිරීමෙන් පසු සමාජයට නැවත ඒකාබද්ධ වීමට සුදුසු ස්ථානයක් නොමැති විට, විවිධ පුද්ගලයින් විසින් ඔවුන් අපයෝජනය කිරීම සහ සූරාකෑම වැළැක්වීමේ අරමුණින්, යම් යම් කොන්දේසි යටතේ පුද්ගලයින්ට මෙම ආයතනවල දිගටම පදිංචි වීමට ඉඩ සැලසෙන පරිදි අදාළ නීති සංශෝධනය කිරීමට අප අපේක්ෂා කරනවා.

● **ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ දත්ත පද්ධතියක්**

ජනගහනයෙන් සැලකිය යුතු පිරිසක් එක් හෝ වැඩි ආබාධයකින් පෙළෙනවා. ඔවුන්ගේ ව්‍යාප්තිය, දුෂ්කරතා, අධ්‍යාපන මට්ටම, ආර්ථික කටයුතුවල නියැළීමේ හැකියාවන් සහ රැකියා පිළිබඳ විශ්වාසදායක දත්ත පදනමක් නොමැති බව අපට නිරීක්ෂණය වන කරුණක්. එබැවින්, 2025 වර්ෂයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ලේකම් කාර්යාලය යටතේ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ පුළුල් දත්ත සමුදායක් ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට අප යෝජනා කරනවා.

● **ආපදා සහන**

ආපදා නිසා ජීවිත අහිමි වූ සහ ස්ථිර වශයෙන් ආබාධිතභාවයට පත් වූ පුද්ගලයන්ට මේ වන විට රුපියල් 250,000 ක වන්දියක් ගෙවනු ලැබේ. ස්වභාවික ආපදා සහ වන සත්වයන්ගෙන් සිදුවන හානි නිසා සිදුවන මරණ හා පූර්ණ ආබාධිත තත්වයන් සඳහා ගෙවන වන්දි මුදල රුපියල් 1,000,000 දක්වා ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

ආපදාවන් නිසා හානියට ලක් වූ ළමා නිවාස, වැඩිහිටි නිවාස සහ ආබාධ සහිත පුද්ගලයන් සඳහා වූ මධ්‍යස්ථාන ආදී වූ දේපොළ සඳහා රුපියල් මිලියන 2.5 ක වන්දි මුදලක් ලැබෙන යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබේ.

10 පිටුවට ▶